ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

රහස්‍යයි

**අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2025(2026)**
**க.பொ.த. (சா.தர)ப் பரீட்சை - 2025(2026)**

විෂය අංකය / பாட இலக்கம்: **40**　　විෂය / பாடம்: **පෙරදිග සංගීතය**

## I පත්‍රය - පිළිතුරු
## I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 1 | 21. | 4 | 31. | 3 |
| 02. | 1,2,3,4 | 12. | 2 | 22. | 2 | 32. | 1 |
| 03. | 4 | 13. | 1 | 23. | 1 | 33. | 2 |
| 04. | 2 | 14. | 4 | 24. | 4 | 34. | 3 |
| 05. | 3 | 15. | 2 | 25. | 3 | 35. | 4 |
| 06. | 2 | 16. | 3 | 26. | 4 | 36. | 3 |
| 07. | 4 | 17. | 3 | 27. | 4 | 37. | 1 |
| 08. | 2 | 18. | 3 | 28. | 2 | 38. | 2 |
| 09. | 1 | 19. | 1 | 29. | 3 | 39. | 4 |
| 10. | 3 | 20. | 2 | 30. | 2 | 40. | 3 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள்　**01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை: **25 / 40**

I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி: **25 / 40**

Past Papers Wiki



## 40 - සංගීතය පෙරදිග

## II පත්‍රය

1. අංක (i) සිට (iv) තෙක් අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමග ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

   (i) විවාදී ස්වර ද ඇතුළත්ව ස්වර 12 ම භාවිත කළ හැකි සර්වකාලීන රාගය නම් කරන්න.

   (ii) කාෆි රාගයේ යෙදෙන එක් විවාදී ස්වරයක් නම් කරන්න.

   (iii) අටවන මාත්‍රාව මත ඛාලිය යෙදෙන නිර්දේශිත තාලය නම් කරන්න.

   (iv) ස රි ප යන ස්වර අනුවාදී වශයෙන් යෙදෙන රාගය නම් කරන්න.

- අංක (v) සිට (viii) තෙක් ඇති ප්‍රශ්න යටතේ යෙදී ඇති හිස් තැන් සඳහා නිවැරදි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමග ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

   (v) 'මව්පියො ආදී' ලෙස ආරම්භ වන ග්‍රැමෆෝන් ගීතය ගායනය කර ඇත්තේ කෝකිලදේවි වීරතුංග සහ .............................. විසිනි.

   (vi) මුල් යුගයේ ගුවන් විදුලි සරල ගීතයක් වන 'එන්ඩද මැණිකේ මමත් දියඹටා' ගීතයේ සංගීත නිර්මාණය කර ඇත්තේ .............................. සූරීන් විසිනි.

   (vii) 'කුමටද සොබනියේ, ඇහැල මලින් ගස් පිරිලා' යන ගීත ඇතුළත් දයානන්ද ගුණවර්ධන සූරීන්ගේ නරිබෑනා නාට්‍යයේ සංගීත නිර්මාණය කර ඇත්තේ .............................. සූරීන් විසිනි.

   (viii) 'ගමට කලින් හිරු මුළුතැන්ගෙට වඩනා' ගීතය ශ්‍රී ලංකා සරල ගීත ක්ෂේත්‍රයේ භාවිත වන .............................. ප්‍රකාශිත නිර්දේශිත ගීතයකි.

(ලකුණු 01 × 08 = 08 යි)

- අංක (ix) සහ (x) ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමග ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

   (ix) 'මෝරා බීජයෙනා' වශයෙන් පද යෙදෙන (a) .............................. වන්නම ගයනු ලබන්නේ (b) .............................. තිතට ය.

   (x) 'අතට වෙරළු ඇහිඳ ගෙනේ' මෙම ගී පාදයේ ඇතුළත් ලඝු අකුරු ගණන (a) .............................. කි. ගුරු අකුරු ගණන (b) .............................. කි.

(ලකුණු 02 × 02 = 04 යි)

(මුළු ලකුණු 12 යි)

i. භෛරවී

ii. ශුද්ධ ගාන්ධාරය / ශුද්ධ නිෂාදය (ශුද්ධ ග / ශුද්ධ නි)

iii. දීප්චන්දි

iv. භූපාලි

v. එච්.ඩබ්.රූපසිංහ (රූපසිංහ මාස්ටර්)

vi. ආනන්ද සමරකෝන්

vii. ලයනල් අල්ගම

viii. මව්ගුණ ගී / මව්ගුණ වරුණ ගී

*(ලකුණු 01 x 08 = 08)*

ix. a) උකුසා b) මහ තනිතිත

x a) 10 b) 01

**2.** පහත A, B සහ C අක්ෂර යටතේ දක්වා ඇති රාග සංගති ලක්ෂණ සලකන්න.

A – ශුද්ධ මධ්‍යමය භාවිත රාත්‍රී කාලයේ ගාන සමය යෙදෙන රාගය

B – විකෘති ස්වර එකක් පමණක් ඇතුළත් රාගය

C – දිවා ප්‍රථම ප්‍රහරයේ ගාන සමය යෙදෙන සඩ්ජය සංවාදි වන රාගය

(i) ඉහත A, B සහ C අක්ෂර යටතේ සඳහන් ලක්ෂණවලින් පිළිබිඹු වන හින්දුස්තානි රාග තුන අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමග වෙන වෙන ම ලියා දක්වන්න. (ලකුණු 03 යි)

(ii) ඉහත B හෝ C යන රාග අතරින් එක් රාගයකට අදාළව මධ්‍යලය ගීතයක ස්ථායී කොටස සහ ඊට අදාළ තානාලංකාරයක් නියමිත තාල සංඥා යොදා ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 06 යි)

(iii) ඉහත A, B සහ C යන රාග අතරින් ඔබ විසින් (ii) කොටස සඳහා තෝරාගත් රාගය හැර, වෙනත් රාගයක මේලය, ජාතිය, මුඛ්‍යාංගය, ගාන සමය, ආරෝහණය සහ අවරෝහණය රාගයේ නම සමග ලියා දක්වන්න. (ලකුණු 03 යි)

(මුළු ලකුණු 12 යි)

i. A - කාෆි රාගය

B - යමන් රාගය

C - භෛරවී රාගය

*එක් පිළිතුරක් සඳහා ලකුණු 1 බැගින් (1×3)* *(ලකුණු 03)*

ii. B හෝ C යන රාග දෙකින් එක් රාගයකට අදාළව මධ්‍යලය ගීතයක/වාදිතයක ස්ථායි කොටස හා තානාලංකාරයක් තාල සංඥා සහිතව ප්‍රස්තාර කිරීම.

(තානාලංකාරය එක් විභාගයක් හෝ සම්පූර්ණ කර තිබිය යුතුයි)

- *නිවැරදි ස්වර ප්‍රස්තාරයේ එක් විභාගයකට ලකුණු ½ බැගින් විභාග 8 ක් (ආවර්ත දෙකක්) සඳහා (½ × 8)* — *ලකුණු 04*
- *තාල සංකේත නිවැරදිව යොදා තිබීම සඳහා ලකුණු* — *ලකුණු 01*
- *තානාලංකාරයක් නිවැරදිව ලිවීමට* — *ලකුණු 01*

iii. A B සහ C යන රාග අතරින් දෙක කොටස සඳහා තෝරා ගත් රාගය හැර අනික් රාගයක මේලය, ජාතිය, මුඛ්‍යාංගය, ගානසමය, ආරෝහණ සහ අවරෝහණ රාග විස්තර ලිවීම.

| රාග විස්තර | කාෆි රාගය | යමන් රාගය | භෛරවී රාගය |
|---|---|---|---|
| මේලය | කාෆි | කල්‍යාණ | භෛරවී |
| ජාතිය | සම්පූර්ණ | සම්පූර්ණ | සම්පූර්ණ |
| මුඛ්‍යාංගය | සස රිරි ගුගු මම ප | නිරි ගරිස, පම් ගරිස | මගු සරිස ධුනිස |
| ගාන සමය | රාත්‍රී දෙවන ප්‍රහරය<br>මධ්‍යම රාත්‍රිය<br>රාත්‍රී තෙවන ප්‍රහරය | රාත්‍රී ප්‍රථම ප්‍රහරය | දිවා ප්‍රථම ප්‍රහරය<br>සර්ව කාලීන |
| ආරෝහණ | ස රි ගු ම ප ධ නි ස් | ස රි ග ම් ප ධ නි ස් | ස රි ගු ම ප ධු නි ස් |
| අවරෝහණ | ස් නි ධ ප ම ගු රි ස | ස් නි ධ ප ම් ග රි ස | ස් නි ධු ප ම ගු රි ස |

*එක් කරුණකට ලකුණු ½ බැගින් (½× 6)* *(ලකුණු - 03)*

*මුළු ලකුණු 12 යි.*

3. නිර්දේශිත රාග දෙකකට අයත් වාදිතයක මුල් ආවර්තයක් සහ තානාලංකාරයක් A සහ B වශයෙන් පහත දැක්වේ.

A

| x | 2 | 0 | 3 |
|---|---|---|---|
| ග – ග රි | ග පප ධප | ග රි ග රි | ස ධ̣ ස රි |

B

| x | 2 | 0 | 3 |
|---|---|---|---|
| ගප ධනි සංනි | ධප මග මරි ස– | ගම පග මරි | ගරි ගප ධනි සං– |

(i) ඉහත A හා B ස්වර ප්‍රස්තාර කොටස් අයත් රාග දෙක අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමග නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ඉහත A අක්ෂරයෙන් දැක්වෙන රාගයට අයත් මධ්‍යලය ගීතයක අන්තරා කොටසේ ස්වර ප්‍රස්තාරය, නියමිත තාල සංකේතය සමගින් ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 05 යි)

(iii) ඉහත B අක්ෂරයෙන් දැක්වෙන තානාලංකාරයට අදාළ තාලය නම් කර, එම තාලයට අයත් ඨේකාව, නියමිත මාත්‍රා විභාග, තාල සංඥා යොදමින් ප්‍රස්තාර කරන්න. (ලකුණු 05 යි)

**(මුළු ලකුණු 12 යි)**

i. A - භූපාලි රාගය

B - බිලාවල් රාගය

*A, B අක්ෂර වලින් කියැවෙන නිර්දේශිත රාග දෙක නම් කිරීම සඳහා ලකුණු (1 × 2)*

*(ලකුණු - 02)*

ii. A අක්ෂරයෙන් කියැවෙන නිර්දේශිත රාගයකට අදාළ මධ්‍යලය ගීතයක හෝ වාදිතයක අන්තරා කොටසට අදාළ ස්වර නිවැරදිව ප්‍රස්තාර කිරීම.

- *එක් විභාගයකට ලකුණු (½×8) බැගින් මුල් ආවර්ත දෙක ප්‍රස්තාර කිරීමට.* *ලකුණු.- 04*
- *තාල සංඥා නිවැරදිව ලකුණු කිරීමට.* *ලකුණු.- 01*

*ලකුණු 05*

iii. B අක්ෂරයෙන් දැක්වෙන තාලය :- දීප්චන්දි තාලය

*තාලය නම් කිරීමට* *ලකුණු 01*

*ඨේකාව නිවැරදිව ලියා දැක්වීමට* *ලකුණු 02*

*තාල සංඥා නිවැරදිව ලකුණු කිරීමට* *ලකුණු 01*

*මාත්‍රා, විභාග නිවැරදි වීමට* *ලකුණු 01*

*ලකුණු 05*

*මුළු ලකුණු 12 යි.*

4. (i) "මහනුවර යුගයේදී ආරම්භ වූ ගීත විශේෂයක් ලෙස උඩරට වන්නම් හැඳින්විය හැකි ය."

පහත දැක්වෙන ශීර්ෂ ඔස්සේ ඒ පිළිබඳව කෙටි විස්තරයක් කරන්න.

A – පදමාලා නිර්මාණයට පාදක වූ තේමාවන්

B – පාදක වී ඇති සංගීත ආභාසය

C – භාවිත කළ අවනද්ධ භාණ්ඩ (ලකුණු 04 යි)

(ii) පතල් ගී හා බඹර ගී අතර සමානතා **දෙකක්** සහ අසමානතා **දෙකක්** ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) ඇදහිලි ගී යටතට එන ශාන්තිකර්ම ගී වර්ග නම් කර, ඉන් **එක්** වර්ගයකට අයත් ගී පාදයක් ලියා දක්වන්න. (ලකුණු 04 යි)

**(මුළු ලකුණු 12 යි)**

i. A B C යන ශීර්ෂවලට අදාළ කරුණු පිළිබඳ කෙටි විස්තරයක් කිරීම.

A - සතුන්, සිද්ධියක් හෝ වෙනත් වස්තූන් පිළිබඳ වර්ණනා පදමාලා නිර්මාණයට පාදක වීම.

B - කර්ණාටක සංගීතයේ ආභාසය ලැබීම.

C - අවනද්ධ භාණ්ඩ ලෙස ගැටබෙරය, (උඩරට බෙරය......) උඩැක්කිය, රබාන වැනි වාද්‍ය භාණ්ඩ භාවිත කිරීම.

*එක් ශීර්ෂයකට එක් ලකුණ බැගින් ලකුණු 03*
*කෙටියෙන් විස්තර කිරීමට ලකුණු 01* } *ලකුණු - 04*

ii. පතල් ගී හා බඹර ගී වල සමානතා හා අසමානතා දෙක බැගින් ලිවීම

සමානතා.

- ගී වර්ග දෙකම අනාඝාතාත්මකව ගැයීම.
- ඒකලව ගායනය කිරීම
- ස්වර පරාසය පටුවීම.
- උස් හඬින් ගායනා කිරීම
- ඇද පැද ලෙලවා ගයන අතර දීර්ඝ යති යෙදීම.
- 

අසමානතා.

- පතල් ගී හා බඹර ගීතයන්හි නාදමාලා එම කාර්යයේ ස්වභාවය අනුව වෙනස් වීම.
- බඹර කැපීම සජීවී සතුන් හා සම්බන්ධ වන අතර පතල් කර්මාන්තයට අජීවී වස්තූන් සම්බන්ධ වීම.
- ඇතැම් පතල් ගී ආඝාතාත්මකව ද ගැයෙන අතර, බඹර ගී අනාඝාතාත්මකව පමණක් ගායනය කිරීම.
- පතල් ගී වලින් විඩාව, දුක්බර බව.......... ප්‍රකාශ වන අතර බඹර ගීවලින් මානුෂීය අගයන් ප්‍රකාශ වීම.

*සමානතා දෙකක් ලිවීමට ලකුණු 02*
*අසමානතා දෙකක් ලිවීමට ලකුණු 02* } *ලකුණු - 04*

iii.
- උඩරට ශාන්ති කර්ම ගී
- පහතරට ශාන්ති කර්ම ගී
- සබරගමු ශාන්ති කර්ම ගී

*ශාන්තිකර්ම ගී වර්ග තුන නිවැරදිව නම් කිරීමට (1×3) — ලකුණු 03*
*එක් වර්ගයකට අයත් ගී පාදයක් ලියා දැක්වීමට — ලකුණු 01*
*} ලකුණු - 04*

*මුළු ලකුණු 12 යි*

5. (i) පහත කියවීම් පත්‍රිකාව කියවා, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**කියවීම් පත්‍රිකාව**

'දුලා නෙතුපුලා', 'ප්‍රේමයෙන් මන රංජිතවේ නන්දිතවේ' වැනි රසවත් ගීත ගණනාවකින් යුත් මෙම නව නාට්‍යය අද දින රාත්‍රී 8.00 ට පේරාදෙණිය සරසවි බිමේදී එළි දැක්වීමට සියල්ල සූදානම් කර ඇත. දිවයිනේ ප්‍රසිද්ධ මද්දල් වාදන ශිල්පීන් දෙදෙනෙකු විසින් තාල වාදනය කරන අතර, මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් චුල්ලධනුද්ධර ජාතක කතාව ආශ්‍රයෙන් මෙම නාට්‍ය නිෂ්පාදනය කර ඇත.

(a) ඉහත කියවීම් පත්‍රිකාවේ සඳහන් ගීත දෙක ඇතුළත් නව නාට්‍යය නම් කරන්න.

(b) එම නාට්‍ය වර්ගයටම අයත් වන වෙනත් නාට්‍ය **දෙකක්** නම් කර එම එක් එක් නාට්‍යයෙහි ඇතුළත් ගී පාදයක් බැගින් අදාළ නාට්‍යයෙහි නම ඉදිරියෙන් ලියා දක්වන්න. (ලකුණු 05 යි)

(ii) නාඩගම් සහ නූර්ති ශෛලීන් හි සංගීතමය ලක්ෂණ **හතරක්** සංසන්දනය කර ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) පහතරට ශාන්ති කර්ම ගී ආභාසයෙන් ගී තනු නිර්මාණය වී ඇති රංග ශෛලිය හඳුන්වා එහි ඇතුළත් ගීතයක මුල් පාද **දෙකක්** ලියන්න. (ලකුණු 03 යි)

**(මුළු ලකුණු 12 යි)**

i. (a) මනමේ

(b) 1956 න් පසු බිහිවූ නව නාට්‍ය දෙකක් නම් කර එම නාට්‍ය දෙකට අදාළ ගීත දෙකක ගී පාද දෙකක් ලිවීම.

(සිංහබාහු, කාලගෝල, තවු, තාරාවෝ ඉගිලෙති, මුහුදු පුත්තු, තෙයිනගේ සුදුව, රාජ කපුරු, අබුද්දස්ස කෝළම, අන්දරේලා............... වැනි ඕනෑම නව නාට්‍ය දෙකක් හා ඊට අදාළ ගීත පාද දෙකක් ලියා තිබීම)

*a) නාට්‍ය නම් කිරීමට — ලකුණු 01*
*b) නාට්‍ය දෙකක් නම් කිරීමට — ලකුණු 02*
*එම නාට්‍ය දෙකට අදාළ ගීත පාද දෙකක් ලිවීමට — ලකුණු 02*
*} ලකුණු 05*

ii. • නාඩගම් නාට්‍ය සඳහා දකුණු ඉන්දියානු සංගීත ආභාසය ලැබී ඇති අතර, නූර්ති නාට්‍ය සඳහා උතුරු ඉන්දියානු සංගීත ආභාසය ලැබීම.

- නාඩගම්වල ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය මද්දලය වන අතර නූර්ති සඳහා තබ්ලාව භාවිත වීම.
- උරුට්ටුව නම් සුවිශේෂී ගායන අංගය නාඩගම් ගීතවල භාවිත වන අතර, දොහොරාව නම් සුවිශේෂී ගායන අංගය නූර්ති ගීතවල භාවිත වීම.
- නාඩගම් ගීවල සුවිශේෂී ගීත ආකෘතියක් නොමැති අතර නූර්ති ගීත තුළ ස්ථායි අන්තරා ගීත ආකෘතියක් තිබෙන බව.
- නාඩගම් වල පසත්, චාපු, වඩිමෝඩි, තංගපාඨ වැනි මද්දල පද භාවිත වන අතර නූර්ති ගී දාදරා, කෙහෙරවා, බෙම්ටෝ, දීප්චන්දි වැනි හින්දුස්ථානී තාල මත නිර්මාණය වී ඇති බව.
- නාඩගම් නාට්‍ය වල ගීතාත්මක දෙබස් ඇතළත් වන අතර, නූර්ති නාට්‍යවල ගීතාත්මක දෙබස් නොමැති බව .

(මීට අමතරව ගැලපෙන පිළිතුරු ලබා දී ඇත්නම් ලකුණු හිමි වේ)

*සංසන්දනාත්මක එක් කරුණකට ලකුණු 1 බැගින්*

*කරුණු 4 ක් ලිවීමට (1 × 4) ලකුණු - 04*

iii. • කෝලම් නාට්‍ය සම්ප්‍රදාය

*කෝලම් රංග ශෛලියට අදාළ ගීතයක මුල් ගී පාද දෙකක් ලිවීම*
*(ඕනෑම කෝලම් ගීතයක මුල් පාද දෙකක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න)*

*කෝලම් නාට්‍ය සම්ප්‍රදාය නම් කිරීමට ලකුණු 01*
*මුල් ගී පාද දෙකක් ලිවීමට ල. 1 බැගින් ලකුණු 02* } *ලකුණු - 03*

*මුළු ලකුණු 12 යි.*

6.




(i) ඉහත දක්වා ඇති අපරදිග ස්වර ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට පෙරළා ප්‍රස්තාර කරන්න. (අපරදිග C ස්වරය පෙරදිග 'ස' ස්වරයට සමාන යැයි සලකන්න.) (ලකුණු 04 යි)

(ii) ඉහත ප්‍රස්තාරයේ අංක 1 සිට 6 තෙක් අංකනය කර ඇති සංකේත අතරින් ඕනෑම **හතරක්** අදාළ අංකය සමග නම් කර ඉන් **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) Semibreve Rest, Dotted Quaver, Dotted Crochet මෙම සංකේත අතරින් තෝරාගත් සංකේත **දෙකක** රූප සටහන් කෙටි ස්වර මණ්ඩලයක් (Short Staff) තුළ ඇඳ දක්වන්න. (ලකුණු 02 යි)

**(මුළු ලකුණු 12 යි)**

i.

| + සං නි | ධ - - | - ග රි | ග - - |

| - ධු ස | ම - - | - ප ම | ග - - |

*නිවැරදි එක් විභාගයකට ලකුණු ½ බැගින්* *ලකුණු - 04*

ii.

1. Treble Clef
2. Time Signature
3. Crotchet Rest
4. Dotted Minim
5. Tie Note
6. Double Bar Line / End Bar Line/ Bar Line

*සංකේත 04 ක් නිවැරදිව නම් කිරීමට ලකුණු ½ x 4* *ලකුණු - 02*

Treble Clef

- රේඛා මණ්ඩලය (Stave/Staff) මත මධ්‍ය සප්තකයේ සහ උච්ච සප්තකයේ ස්වර සලකුණු කරන විට යොදනු ලබන සංකේතය බව.
- G ස්වරයට අදාළ රේඛාවෙන් ආරම්භ කරන බැවින් G Clef ලෙස හඳුන්වන බව.
- Treble Clef රේඛා මණ්ඩලයක ස්වර පිහිටීම දක්වා ඇතිවිට,

  5 Lines Notes - E,G,B,D,F

  4 Spaces - F,A,C,E

Time Signature

PAST PAPERS WIKI

- අපරදිග ස්වර ප්‍රස්තාරයක තාලය හඟවනු ලබන සංකේතය බව
- රේඛා මණ්ඩලයක සළකුණු කිරීමේදී Clef සංකේතය ආසන්නයේම සලකුණු කරනු ලබන බව.
- ඉහළින් ඇති ඉලක්කම මගින් විභාගයට හිමි මාත්‍රා සංඛ්‍යාවත්, පහළින් ඇති ඉලක්කමෙන් එම මාත්‍රා සංඛ්‍යාව තිබිය යුතු සංකේත වර්ගයත් දැක්වෙන බව.
- Time Signature ලෙස සළකුණු කළහැකි සංකේත දක්වා තිබීම

## Crotchet Rest

- මාත්‍රා 1ක වටිනාකමක් විරාම(නිහඬ) වන බව
- මේ සඳහා යොදනු ලබන සංකේත 2ක් භාවිතයේ ඇති බව.




## Dotted Minim

- මාත්‍රා තුනක වටිනාකම පෙන්වීමට අඳිනු ලබන සංකේතය බව

## Tie Note

- එකම තාරතාවයේ ස්වර දෙකක් හෝ වැඩි ගණනක් අඛණ්ඩව වාදනය කිරීම සිදු කිරීමේදී එම සංකේතය භාවිත කරන බව.
- එක සමාන ස්වර දෙකක් හෝ කිහිපයක් හඬ නොකඩවා වාදනය කළ යුතු බව පෙන්වීමට යොදනු ලබන සංකේතය බව
- පෙර විභාගයේ ඇති ස්වරයම ඊළඟ විභාගය තුළත් යම් මාත්‍රා ප්‍රමාණයක් නොකඩවා වාදනය වන බව

## Double Bar Line

- අපරදිග ස්වර ප්‍රස්තාරයක් අවසන් වන බව පෙන්වීමට යොදනු ලබන සංකේතය
- විභාග වෙන්කරණු ලබන රේඛාව ලෙස ලියාතිබීමටත්,

*සංකේත 02 ක් නිවැරදිව විස්තර කිරීමට ලකුණු **2 x 2** ලකුණු - 04*

iii.

- semibreve Rest



- Dotted Quaver



- Dotted Crotchet



*සංකේත 02 ක් නිවැරදිව ඇඳ දැක්වීමට ලකුණු **1 x 2** ලකුණු - 02*
*මුළු ලකුණු 12 යි.*

**7.** පහත සඳහන් ප්‍රශ්න අතුරෙන් ඕනෑම ප්‍රශ්න **තුනකට** පිළිතුරු සපයන්න.

(i) චිත්‍රපට ගීත, සරල ගීත හා ග්‍රැමෆෝන් ගීත අතුරෙන් තෝරාගත් එක් ගී වර්ගයක සංගීතමය ලක්ෂණ පිළිබඳව පහත කරුණු ඔස්සේ කෙටියෙන් පැහැදිලි කරන්න.

- ගී තනුව
- පෙර අතුරු වාදන
- සංගීත ශිල්ප ක්‍රම
- සංගීත ආභාසය

(ii) ලංකාවේ නිෂ්පාදිත ප්‍රථම සංධ්වනි කිහිපය නිර්මාණය කළ දේශීය ජන සංගීතඥයාගේ එම සංධ්වනි නිර්මාණ සහ වෙනත් සංගීත කෘතීන් පිළිබඳ ව ඇගයීමක් කරන්න.

(iii) සංගීත මෘදුකාංග යොදා ගනිමින් පරිගණකය ඇසුරින් ගීතයක් පටිගත කරන ආකාරය සරලව පැහැදිලි කරන්න.

(iv) පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගෙන දී ඇති ස්වර ප්‍රස්තාරයට ගැළපෙන ලෙස පදමාලාවක් නිර්මාණය කර, ස්වර පෙළට යටින් පද ප්‍රස්තාර කර දක්වන්න.

- පුන් පෝදා අසිරිය
- වසන්තය ඇවිත්
- මව්පිය ගුණ සුවඳ
- මගේ සුරතලා

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| + | ස | රි | ග | ම | – | – | – | රි | – | ග | ම | ප | – | – | – |
| ප | – | ම | ග | ම | – | ග | රි | ග | – | රි | නි̣ | ස | – | – | – |
| + | ග | – | ප | ධ | – | – | – | ප | – | ධ | නි | ස̇ | – | – | – |
| ස̇ | නි | ධ | ප | ම | – | ග | ම | ප | – | ග | රි | ස | – | – | – |

**(ලකුණු 04 × 03 = 12 යි)**

i චිත්‍රපට ගීත

- ගී තනුව
  - චිත්‍රපටයේ තේමාවට ගැලපෙන ලෙස තනුව නිර්මාණය වීම.
  - ගීතයේ පද රචනයට අනුව අවස්ථානුකූලව එහි අර්ථය තීව්‍ර කර දැක්වීමට ගී තනුව ඉවහල් . වීම. (උදා:- ශෝකය, සතුට, ආදරය වැනි අවස්ථා)
  - චිත්‍රපටයේ රූප රාමුවට ගැළපෙන ලෙස ප්‍රේක්ෂකයා ආකර්ශණය කර ගත හැකි රිද්මයකට අනුව ස්වර සංයෝජනය වී ඇති බව.
  - සරල මෙන්ම සංකීර්ණ ගී තනු දක්නට ලැබෙන බව.

ඕනෑම කරුණු 4ක් ඇත්නම් ලකුණු දෙන්න.

- පෙර අතුරු වාදන
  - පෙර අතුරු වාදන ඇතුළත් වන බව.
  - ඇතැම් චිත්‍රපටි ගීතවල රූප රාමුවට ගැළපෙන ලෙස පෙර අතුරු වාදන දීර්ඝ ලෙස නිර්මාණය වී තිබීම .
- සංගීත ශිල්ප ක්‍රම
  - බටහිර සංගීත ශිල්ප ක්‍රම (Bits, Counter - points, Chords, Harmony……) භාවිත වන බව.
  - පෙරදිග සංගීත ශිල්ප ක්‍රම (ආලාප, තානාලංකාර, තබ්ලා බෝල්....) භාවිත වන බව.
  - පෙරදිග, අපරදිග හා දේශීය වාද්‍ය භාණ්ඩ යොදා ගැනෙන බව.

- සංගීත ආභාසය
    - පෙරදිග හා අපරදිග මෙන්ම දේශීය සංගීත පද්ධතිවල ආභාසය ලබා තිබෙන බව.
    - කණ්ඩායම් සංගීතයේ ආභාසය මෙන්ම කපිරිඤ්ඤා සංගීතයේ ආභාසය ද ලබා ඇති බව.

සරල ගීත

- ගී තනුව
    - සරල මෙන්ම සංකීර්ණ ගී තනු දක්නට ලැබීම.
    - ගීතයේ පද මාලාවට උචිත පරිදි එහි අර්ථය තීව්‍ර කර දැක්වීමට ගී තනුව ඉවහල් වීම.
    - ශ්‍රාවකයාගේ රසවින්දනයට ඉවහල්වන බව.
    - මූලික ශ්‍රැතිය හා ස්කේලය භාව ප්‍රකාශනයට ගැලපෙන පරිදි යොදා ගන්නා බව.
- පෙර අතුරු වාදන
    - බොහෝ සරල ගීතවල පෙර අතුරු වාදන ඇතුළත් වන බව.
    - සරල ගීතයට අලංකාරවත් බවක් ලැබෙන බව.
    - ස්ථායි, අන්තරා කොටස් වලට පහසුවෙන් ප්‍රවේශවීමට හැකි වන බව.
- සංගීත ශිල්ප ක්‍රම
    - Bits, Counter - points, Chords, Harmony ....ආදිය ඇතුළත් බව.
    - විවිධ සංගීත සම්ප්‍රදායන් වලට අයත් සංගීත භාණ්ඩ භාවිත කිරීම.
    - විවිධ සංගීත සම්ප්‍රදායන් වලට අයත් ශිල්ප ක්‍රම භාවිත කරන බව.
- සංගීත ආභාසය
    - විවිධ සංගීත පද්ධතීන්වල ආභාසය ලබා තිබීම.(පෙරදිග/අපරදිග/දේශීය ජන සංගීතය........)
    - කණ්ඩායම් ගීත/කපිරිඤ්ඤා ගීතවල........... ආභාසය ලබා ඇති බව.

ග්‍රැමෆෝන් ගීත

- ගී තනුව
    - එක් එක් යුගයන්ට අදාළව හින්දි, ද්‍රවිඩ හා බටහිර සංගීත සම්ප්‍රදායන්ගේ අනුකාරක ගී තනු මෙන්ම රාගධාරී හා ස්වාධීන ගී තනු ද, නිර්මාණයන්ට දායක වී ඇති බව
    - සරල මෙන්ම සංකීර්ණ ගී තනු ද දක්නට ලැබීම.
- පෙර අතුරු වාදන
    - මුල් යුගයේ දී පෙර අතුරු වාදන ලෙස ගීතයේ මුල් කොටස වාදනය කර ඇති බව.
    - ඇතැම් ගීතවල පෙර අතුරු වාදන නොමැති වීම.
    - අනුකාරක ගී යුගයේ දී එම ගීතවල ඇතුළත් පෙර අතුරු වාදන එලෙසම යොදා ගෙන තිබීම.

Past Papers Wiki



- සංගීත ශිල්ප ක්‍රම
  - අවම සංගීත භාණ්ඩ ප්‍රමාණයක් යොදාගෙන තිබීම.
  - අවම සංගීත භාණ්ඩ ප්‍රමාණයක් භාවිත වීම මත කටහඬ ඉස්මතු වන බව.
- සංගීත ආභාසය
  - බටහිර, ද්‍රවිඩ, හින්දි සංගීත සම්ප්‍රදායන්ගේ ආභාසය ලත් ගී තනු අනුකරණය කර තිබෙන බව මෙන්ම, රාගධාරී සහ වංග සංගීතයේ ආභාසය ලත් ගීත ද තිබෙන බව.

(ඉහත පිළිතුරු වලට අමතරව වෙනත් ගැළපෙන කරුණු ඇතුළත් වේ නම් ලකුණු ලබා දෙන්න.)

***ඉහත සඳහන් එක් ශීර්ෂයකට ලකුණ 01 ක් බැගින් ලකුණු 4 ක් හිමි වේ. ලකුණු - 04***

ii. • නිර්මාණය කරන ලද සංධ්වනි
  - ගොයම් දා මඟුල,
  - මාර පරාජය
  - හිරගෙයින් මරුමුවට
  - මහාභිනිෂ්ක්‍රමණය
- ග්‍රන්ථ
  - හෙළ ගී මග
  - අභිනව මූලික ගීත
- නිර්මිත නාට්‍ය
  - දෙපානෝ
  - පහනින් පහන
  - තරණය
  - අඳුරු වළා පලා ගියා
- නිර්මිත චිත්‍රපට
  - අරුණට පෙර

සංධ්වනි 2 ක් තියෙන්න ඕන. ලකුණු 2.

***සංධ්වනි නිර්මාණ ඇගයීමට ලකුණු 02***
***නිර්මාණය කර ඇති වෙනත් කෘති ඇගයීමට ලකුණු 02*** } ***ලකුණු - 04***

iii. • සංගීත මෘදුකාංග යොදා ගැනීම.
  - පරිගණකයේ පටිගත කිරීමේ මෘදුකාංගයක් (DAW) ස්ථාපනය කර තිබීම. (Cubase, Nuendo, Adobe Audition, Pro Tools.....වැනි)
  - පටිගත කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය උපකරණ නම් කිරීම. (Sound card(Audio InterFace), Speaker , Microphone, Headphone සහ අදාළ කේබල් වර්ග)
  - පරිගණකයට Sound Card සම්බන්ධ කර, අනෙකුත් උපකරණ Sound Card එකට සම්බන්ධ කළ යුතු බව.
  - වාද්‍ය භාණ්ඩ භාවිත කර පටිගත කිරීම සිදුකරන්නේ නම්, අදාළ සංගීත භාණ්ඩ සූදානම් කර ගැනීම සහ සම්බන්ධ කරගැනීම.
  - Audio Track එකකට කටහඬ පමණක් භාවිත කර ගීතය පටිගත කරන්නේ නම් අදාළ Audio Track එක සපයා ගත යුතු බව.

PAST PAPERS WIKI



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

- පටිගත කරන ආකාරය
  - පරිගණකයේ ස්ථාපනය කර ඇති මෘදුකාංගය විවෘත කර ගැනීම.
  - Sound Card එක හා පරිගණකය අතර සම්බන්ධතාවය සකසා ගැනීමට අවශ්‍ය Audio Settings සකසා ගැනීම.
  - Track එකෙහි ඇති අයිකන වලින් පටිගත කිරීම සඳහා සූදානම් කර ගන්නා අයිකනය Click කිරීම (Record eanable)

*මෘදුකාංග හා උපකරණ නම් කිරීමට ලකුණු 02*
*පටිගත කරන ආකාරය පැහැදිලි කිරීමට ලකුණු 02* } *ලකුණු - 04*

iv. දී ඇති ස්වර ප්‍රස්තාරයට හා මාතෘකාවලට අදාළව ගී පද නිර්මාණය කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.

*මාතෘකාවට අනුව පද නිර්මාණයට ලකුණු 02*
*පද ප්‍රස්තාර කිරීමට ලකුණු 02* } *ලකුණු - 04*

★ ඕනෑම ප්‍රශ්න තුනකට නිවැරදිව පිළිතුරු ලබා දීම සඳහා ලකුණු **4 x 3**
මුළු ලකුණු 12යි

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library